**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - 2020**

**----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය වියාචනය**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 **මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

1.3 **ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය

වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.5.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි ඡේද 47 අනුව පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීමේදී එම සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර අතීතානුයෝගීව ගැළපිය යුතු වුවද පිළිවෙලින් අමාත්‍යාංශ ප්‍රදාන රු.10,406,175 ක්, ද්‍රවශීලතා හානි රු.273,346 ක් සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය රු.1,893,257 ක් ඒ අනුව ගැළපීම් නොකර එම අගයන් වර්ෂ අවසාන සමුච්චිත ලාභ අලාභ ශේෂයට ගැළපීම් කර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පූර්ව වර්ෂ ගැළපීම් සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීමේදී එම සංසන්දනාත්මක අගයන් නැවත අතීතානුයෝගීව ගැළපිය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උපදේශන සේවා ආදායම් අමාත්‍යාංශ ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට, පූර්ව වර්ෂ ගැළපුම් ලෙස රඳවාගත් ලාභයට ගැළපුම් කර තිබුණු රු.10,406,125 ක් සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රදාන අඩුවීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපුම් කර තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් එම වටිනාකමින් වැඩි වී තිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | පූර්ව වර්ෂ ගැලපුම් ලෙස රඳවාගත් ලාභයට කළ ගැළපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැළපිය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අලාභයට පිළිවෙලින් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය රු.127,404,158 සහ පුනරාවර්ථන වියදම් සඳහා යෙදවූ ප්‍රාග්ධන ප්‍රදාන රු.57,449,328 ක් ලෙස මුළු අගය රු.184,853,486 ක් මෙහෙයුම් මුදල් ප්‍රවාහයට ගැලපීම් කළ යුතු වුවද රු.185,446,753 ක් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය ලෙස ලාභයට ගලපා තිබුණු බැවින් රු.593,267 ක් මෙහෙයුම් මුදල් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | මුදල් ප්‍රවාහයට අදාළ ගනුදෙනු නිවැරදිව ගැළපීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් ලෙස රු.56,841,558ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුළත් කර තිබුණු අතර එහි දේපළ පිරියත උපකරණ සඳහා පූර්ව වර්ෂවල ගෙවන ලද රු.12,603,032 ක් ඇතුළත්වී තිබුණු බැවින්, දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | පූර්ව වර්ෂ වල ගෙවීම් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැළපිය යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු ඉන්ධන ටැංකි ඉදිකිරීම් වලින් රු.9,924,000 ක් වටිනා ඉන්ධන ටැංකි 06ක් 2020 දෙසැම්බර් 28 දින වන විට භාවිතා කරමින් තිබුණු අතර එම ඉන්ධන ටැංකි ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | රුපියල් මිලියන 9,709,000 වටිනා ඉන්ධන ටැංකි 6ට අදාළ මුදල ජර්නල් අංක 294 යටතේ 2021 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. | භාවිතා කරමින් පවතින ඉන්ධන ටැංකි ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) පැරලිය නැංගුරම්පොළෙහි දියකඩන ඉදිකිරීම් කටයුතු අවසන් කර 2018 අගෝස්තු 01 දින රේඛීය අමාත්‍යාංශය විසින් සංස්ථාවට පවරා දී තිබුණද එම ඉදිකිරීම් පිරිවැය වූ රු.314,162,431 ක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. මෙම නිසා ජංගම නොවන වත්කම් ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | පැරලිය නැංගුරම්පොලෙහි දියකඩන ඉදිකිරීම් අවසන් වූ පසු එම වටිනාකම් වලට අදාළ මූලික ලේඛන අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංශය මගින් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | සංස්ථාවට අයිති වත්කම් නිවැරදිව ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) යාපනය දිස්ත්‍රික්කයේ මයිලඩි ධීවර වරාය උතුරු පළාත I කොටසෙහි ගොඩනැඟිලි ඉදිකිරීම, භූමිතෙල් ටැංකි ස්ථාපිත කිරීම, පැති බැම් ඉදිකිරීම ඇතුළු වැඩ කොටස් 8 ක් සඳහා අමාත්‍යාංශය විසින් රු. 107,427,407 ක ඉදිකිරීම් පිරිවැයක් දරා 2019 වර්ෂයේ දි සංස්ථාවට භාර දි තිබුණද එම වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | මයිලඩි ධිවර වාරයේ ඉදිකිරීම් අවසන් වූ පසු එම වටිනාකම් වලට අදාළ මූලික ලේඛන අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංශය මගින් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | සංස්ථාවට අයිති වත්කම් නිවැරදිව ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේදී ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියක රාජකාරී සඳහා සයුර කැණීම් යාත්‍රාව යෙදවීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.9,653,000 ක කුලී ගාස්තු හා කලපු ගැඹුරු කිරීම් පරීක්ෂා කිරිමේ කටයුතු සඳහා අයවිය යුතු රු. 871,560 ක මුදලද සමාලෝචිත වර්ෂයේ ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර මේ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අලාභය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්ගත කර ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඟ) ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව ගණනය කර නියමිත කාලය තුළ ගෙවීම් කිරීම සිදුකළ යුතු වුවත් 2006 සිට 2013 දක්වා වර්ෂවල ජීවන වියදම් දීමනාව නොමැතිව සේවක අර්ථසාධක අරමුදල් ගණනය කිරීම හේතුවෙන් රු. 85,059,367 ක හිඟ මුදල් සහ රු.42,529,684ක අධිභාර මුදල් සහනයක් ලෙස මාසික වාරික 72 කින් ගෙවීමට නියම වී තිබුණු නමුත් ඉන් ගිණුම්ගත කර ඇත්තේ රු.21,896,628 ක හිඟ මුදල් සහ රු.7,118,475 ක අධිභාර මුදල් පමණක් වන අතර ඒ අනුව රු.63,162,739 ක හිඟ මුදල් සහ රු.35,411,209 අධිභාර මුදල් මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගිණුම්ගත කර ඇත. | ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව ගණනය කර නියමිත කාලයට අදාළව මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂය තුළදී අලුත්වැඩියා කරන ලද තංගල්ල හා මීගමුව ධීවර වරායන්හි වේදිකා බැම් 2 හි වටිනාකම වන රු.7,735,227ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත නොකර අදාළ වරායන්හි වියදම් වලට ගළපා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | 2021 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. | වේදිකා බැම්වල පිරිවැය පුනරාවර්තන වියදම් සේ නොව ප්‍රාග්ධන වියදම් සේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ අවසන් කළ කිරින්ද ධීවර වරායේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණ කටයුතුවල වටිනාකම වූ රු.10,734,231 ක මුදල ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කිරින්ද ධීවර වරායේ පුනරාවර්තන වියදමට හර කර තිබුණි. | 2021 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. | මාර්ග පද්ධතිය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඔ) සමාලෝචිත වර්ෂයේදී කොඩ්බේ ධීවර වරාය සහ ප්‍රධාන කාර්යාලයේ භාවිතය සඳහා රු. 500,000 ක් ගෙවා මිළදී ගෙන තිබුණු රේඩියෝ පණිවුඩ (Wallkie Talker) අයිතම 10 ක් උපකරණ ගිණුමට හර නොකර එම වරායේ පුනරාවර්තන වියදමට හර කර තිබුණි. | ජර්නල් අංක 292 යටතේ 2021 වර්ෂයේදී උපකරණ ගිණුමට මාරුකර නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ප්‍රාග්ධනිත වත්කම් පුනරාවර්තන වියදම් සේ ගිණුම්ගත නොකළ යුතුය. |
| (ක) මිරිස්ස,කොඩ්බේ හා කුඩාවැල්ල යන ධීවර වරායන් වල බදුකුලී ආදායම් ලෙජර් ගිණුම් ශේෂ හා අවසන් ගිණුම් ශේෂ අතර රු.1,116,402 ක වෙනසක් නිරීක්ෂණය වුව ද එම වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | දේපළ බදු දීම වෙනුවෙන් ලැබිය යුතු ආදායමට අමතරව අවසන් ගිණුම් ශේෂයන්හී දෛනිකව බෝට්ටු ගොඩබිම තබා ගැනීම වෙනුවෙන් අයකරන මුදල් බදුකුලී ආදායම් තුළට ඇතුළත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන හා ලෙජර් ගිණුම් ශේෂ වල දක්වා තිබෙන අගයන් අතර වෙනස් වීම් සොයා බලා නිවැරදි කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු පිරිවැය රු. 6,679,408,834ක ස්ථාවර වත්කම් වර්ග 23 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛන රු.945,559,937ක් වූ සුනාමියෙන් හානි වූ වත්කම් වෙනුවෙන් වූ සංචිතයට අදාළ විස්තරාත්මක උපලේඛනය, වටිනාකම රු.9,824,409ක් වූ ණයහිමි ශේෂයන් තහවුරු කර ගැනීමට අදාළ මූලාශ්‍ර ලියවිලි හා උපලේඛනද, රු.90,193,518ක් වූ අමාත්‍යාංශ ප්‍රදාන හා රු.835,175,606 ක් වූ වෙනත් ප්‍රදානවලට අදාළ ප්‍රාග්ධනිත කළ වත්කම්, ප්රදාන ගිවිසුම්, ඉටුකරන ලද කාර්යයන් විස්තරාත්මක උපලේඛන හා මූලාශ්‍ර ලියවිලිද, කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබිය යුතු වසර 10 ක් දක්වා වූ රු.2,150,000 ක් සඳහා ශේෂ තහවුරු කිරීම්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම වටිනාකම රු.83,985,365 ක් වූ ලියාහැරිය යුතු ශේෂ හා රු.1,653,400 ක් වූ විලම්භිත බැරකම්, සම්බන්ධයෙන් මූලාශ්‍ර ලියවිලිද, රු.4,254,111 ක් වූ පරිගණක මෘදුකාංග හා කාර්යාල බිම් සැකසුම් සඳහා කෙරීගෙන යන වැඩ ලිපිගොනු, සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තරද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා මෙම විෂයන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | එකඟ වෙමි. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛන, ශේෂ සනාථ කිරීම්, ගිවිසුම්, විස්තරාත්මක උපලේඛන හා මූලාශ්‍ර ලියවිලිද, ලිපිගොනු යනාදී ලිඛිත සාක්ෂි විගණනය වෙත ලබා දිය යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.87,895,056 ක් වූ කුලී ණයගැති ශේෂයෙන් වසර 1-2 දක්වා රු.25,710,618 ක්ද වසර 2-5 දක්වා රු.45,295,723 ක්ද වසර 5-10 දක්වා රු.16,888,714ක නිරවුල් නොවූ ශේෂයන් වූ අතර රු. 84,581,542 ක් වූ ලැබිය යුතු ණය ශේෂ 7 කින් වසර 5 ට වැඩි ණය ශේෂය රු.60,637,315 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව වරාය අධිකාරියේ ඔලුවිල් ධීවර වරායෙහි කැණීම් කටයුතු සඳහා 2016 දෙසැම්බර් 16 දින සිට 2017 මාර්තු 09 දින තෙක් යොදවා තිබුණි. එසේ වුවත් මේ සඳහා | වරාය අධිකාරියෙන් අදාළ මුදල් අයකර ගැනීමට අවස්ථා කිහිපයකදීම ලිඛිතව ඉල්ලීම් කර ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර වරාය අධිකාරියෙන් සංස්ථාවට මේ සම්බන්ධයෙන් රු.24,840,000 ක මුදල අයකර ගැනීමට ඇති බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුත් වසර 05කට වැඩි කාලයක් ගෙවී ඇති මෙම ශේෂය පියවා ගෙන නොතිබුණි. | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.36,702,978 ක් වූ පෙර ගෙවීම් ශේෂයෙන් රු.27,056,667 ක් වසර 10 කට වඩා පැරණි ශේෂයන් වන අතර රු.9,602,683 ක් වසර 5ට වඩා පැරණි ශේෂයක් විය. 2004 වර්ෂයට පෙර සිට පැවතෙන රු.15,528,683 ක් වටිනා ශේෂද පෙර ගෙවීම් තුළ ඇතුළත් වූ නමුත් එම ශේෂ තහවුරු කිරීමට අවශ්‍ය උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව සංස්ථාව සතු මුදල් මේ ආකාරයෙන් වගකීම් විරහිතව තෙවන පාර්ශවයන් වෙත පරිහරණයට ඉඩ ලබා දී තිබුණු නිලධාරීන්ට එරෙහිව මේ වන තෙක්ම කිසිදු විනය පියවරක් ගෙන නොතිබුණි. | වසර 10 කට වඩා පැරණි ශේෂයන් පිළිබඳ සොයා බැලිමට කමිටුවක් පත් කර ඇත. | පෙර ගෙවීම් කඩිනමින් නිරවුල් කරගැනීමට ක්‍රියාකළ යුතු අතර සංස්ථාව සහ මුදල් අයථා පරිහරණයට ඉඩදී ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට කුලී ණයගැති ශේෂ අතරින් තංගල්ල, කුඩාවැල්ල, පුරාණවැල්ල, ගාල්ල, කොඩ්බේ යන වරායන් 5 හි මුළු එකතුව රු.5,321,494 ක් වටිනා ශේෂ 12 ක් වර්ෂ 05 ක් ඉක්මවා පවතින නමුත් මේ වන තෙක් ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තංගල්ල - රු 137,000 ධීවර සංස්ථාව විසින් මේ වන තෙක් ගෙවීම් කර නොමැත.<br>කුඩාවැල්ල රු. 928,852ක මුදල කුඩාවැල්ල ධීවර වරායේ ආපන ශාලාව බදු දීමෙන් ලැබිය යුතු හිග මුදල වන අතර, මේ සඳහා නඩුපවරා මාසිකව රු. 10,000 බැගින් වරාය වෙත ගෙවීම් කරනු ලබයි.<br>රු. 448,554ක මුදල ධීවර සංස්ථාව විසින් මේ වන තෙක් ගෙවීම් කර නොමැති අතර, මේ වනවිට කුඩාවැල්ල බදු පරිශ්‍රයෙන් ඉවත් වී ඇති බවද දන්වා සිටිමි.<br>රු. 364,872 පුරාණවැල්ල ධීවර වරායේ ඉන්ධන හල බදුදීම වෙනුවෙන් අයවිය යුතු මුදල වන අතර ,මේ සම්බන්ධයෙන් නිතීමය ක්‍රියාමාර්ග ගෙන නොමැත.<br>ගාල්ල රු. 520,768ක මුදල ධීවර සංස්ථාව වෙතින් අයවීමට ඇති | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු අතර හිඟ කුලී ණයගැතියන් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මුදලකි. ගුවන් විදුලි සංඥා මධ්‍යස්ථානය (Radio Room)වෙතින් අයවිය යුතු රු.22,515ක මුදල මේ වනවිට අයකර ගෙන ඇති බව දන්වා සිටිමි.<br>කොඩ්බේ Trincomarine ආයතනයෙන් ලැබිය යුතු රු.42,062ක මුදල අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩුවක් පවරා ඇත.<br>Walkers ආයතනයෙන් ලැබිය යුතු රු. 155,250ක මුදල අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩුවක් පවරා ඇත.<br>රු. 1,379,685ක මුදල ගලප්පත්ති මියට අයත් බහුදින යාත්‍රාව වෙනුවෙන් ලබාදුන් ඉන්ධන වල වටිනාමක වේ.<br>Soild Maritine - රු.1,053,000<br><br>මෙම මුදල් 2021 ජුනි 23 වන දින මුදල් කුවිතාන්සි පත් අංක 604272 මගින් ගෙවා ඇත. | |
| (ඉ) | වැඩ තහනම් කළ, සේවය හැරගිය,විශ්‍රාම ගන්වන ලද හා මියගිය සේවකයන් 12 ක ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.2,039,426 ක සේවක ණය ශේෂයක් අය නොවී හිඟව පැවතුණි. | ණයගැති විශ්ලේෂණය ඉදිරිපත් කරමි. | හිඟ සේවක ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ජංගම වගකීම් තුළ ගෙවිය යුතු ශේෂයක් ලෙස 2014 වර්ෂයේ සිට අඛණ්ඩව පැවත එන රු.10,512,971 ක් වූ ආර්ථික බදු හා 2020 ජනවාරි 01 දිනට පැවති වටිනාකම රු.21,429,875 ක් වූ උපචිත වියදම් පියවීමට කටයුතු කර නොතිබුණි. | වැලි ආදායම් මත ගෙවන ලද එකතු කළ බදු මුදල් වන රු.10,434,783ක මුදල ආර්ථික සේවා බදු වෙනුවෙන් හිලවු කිරීම සඳහා ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කර ඉල්ලීම්කර ඇතත් මේ වන තෙක් ඒ සඳහා අනුමැතිය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ලබාදී නොමැත. | වගකීම් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ආ)ණයහිමියන් තුළ ඇතුළත්ව ඇති එකතුව රු.112,669,731 ක් වූ ශේෂයන් | කිරින්ද ධීවර වරායෙහි වැලි ලබාගැනීම වෙනුවෙන් වෙස්ටර්න් | ගෙවිය යුතු මුදල් නිරවුල් කළ යුතු අතර වැලි ලබා නොදීම |

| | | |
|---|---|---|
| 10 ක් වසර 02 ක් ඉක්මවා ඇති නමුත් පියවීමට කටයුතු කර නොතිබුණි. මේ තුළ කිරින්ද ධීවර වරායෙන් වැලි ලබා ගැනීම සඳහා පුද්ගලික සමාගමකින් ලැබූ රු.මිලියන 80 ක අත්තිකාරම් මුදලින් වැලි ලබා නොදුන් ප්‍රමාණයට අදාළ ආපසු ගෙවිය යුතු රු.76,261,312 ක් ද ඇතුළත් විය. මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ 2017 මාර්තු 01 දිනැති අංක E/11/2017/CFHC දරන ලිපිය අනුව ගිවිසුම් ප්‍රකාරව එම සමාගම විසින් තැන්පත් කරන ලද මුදල් නැවත ගෙවීම සඳහා උපදෙස් ලබාදී තිබුණද විගණිත දිනය වන 2022 ජුනි 20 වන දින වනතුරුත් ඒ සම්බන්ධව කළමනාකරණය තීරණයන් ගෙන නොතිබුණි. | ලංකා (පුද්ගලික) සමාගම විසින් සංස්ථාවට ගෙවන ලද රුපියල් මිලියන 8.80කින්, වැලි ලබාදීමට නොහැකිවීම හේතුවෙන් වෙස්ටර්න් ලංකා (පුද්ගලික) සමාගම වෙත නැවත ගෙවිය යුතුරු. 76,261,312 ක මුදල ණයහිමියන් තුළ දක්වා ඇති අතර ,මෙම මුදල් නීතිපති දෙපාර්තමේන්තුව විසින් නැවත වාරික 10කින් ගෙවන ලෙස දන්වා ඇති අතර ඒ අනුව මෙම මුදල් වාරික වශයෙන් ගෙවීම සිදුකරනු ලබයි. | පිළිබඳව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ කළ යුතුය. |

1.7 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>(i) මු.රෙ. 102 සහ 760 | තොග ලෙජරය හා ඉන්ධන සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ධීවර වරායන් 19 කට අදාළව රු.7,409,186 ක ඩීසල් ලීටර් 67,831.86 ක සහ භූමිතෙල් ලීටර් 8340.33 ක ඌනතාවයක් නිරීක්ෂණය වුවද ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයන් සිදු කර නොතිබුණි. | ඉන්ධන භෞතික තොග පරීක්ෂාවන්හිදී සෑම විටම පොත් අගය සමඟ සුළු සුළු වෙනස්කම් පවතියි. එනම් භෞතික තොග පරීක්ෂාව ඩිප් (Dip) කූර ආධාරයෙන් සිදුකරනු ලබන අතර, එහි කුඩා ඒකකයන් වෙනස් වීම් හේතුවෙන් සුළු සුළු වෙනස් වීම් ඇති විය හැක. තවද උදෑසන කාලයේ සහ සවස් කාලයේ ඉන්ධන තොග පරීක්ෂා කිරීම් වලදීද පොත් අගයන් සමඟ වෙනස්වීම් දැකිය හැක. | ඉන්ධන ඌනතාවයන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ii) මු.රෙ. 371(2) (ආ) | එක් නිලධාරියෙකුට ලබා දිය හැකි තත්කාර්ය අතුරු අග්‍රිමය රු. 100,000 ක් වුවද එම සීමාව ඉක්මවා නිලධාරීන් 4 දෙනෙකුට අග්‍රිම ලබා දී තිබුණි. | අදාළ කාර්යයේ ස්වභාවය සලකා බලා වැයවන මුළු පිරිවැය සඳහා ඇස්තමේන්තු සකස් කර අදාළ අත්තිකාරම් මුදල් ලබා දෙන ලදි. විමසුමෙහි දක්වා ඇති සියලුම අත්තිකාරම් | එක් නිලධාරියෙකුට රු. 100,000 සීමාව ඉක්මවා අතුරු අග්‍රිමයන් ලබා නොදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මුදල් මේ වන විට පියවා ඇත. | |
| (iii) මු.රෙ. 371 (5) | තත්කාර්යය අතුරු අග්‍රිමයන් නිකුත් කර අදාළ කාර්ය අවසන් කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා පැවති තත්කාර්යය අතුරු අග්‍රිමයේ වටිනාකම රු. 4,346,531ක් විය. | 2019 වර්ෂයේ දෙසැම්බර් මස අවසානයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමත් සමඟ ඒ වන විට කළ යුතුව පැවති කාර්යයන් සඳහා අත්තිකාරම් මුදල් ලබා දීම හේතුවෙන් 2020 වර්ෂයේ ජනවාරි 01 වන දින වන විට රු.4,346,531 ක මුදලක් නොපියවූ ශේෂයක් ලෙස පෙන්නුම් කරනු ලබයි. | ලබාගත් අතුරු අග්‍රිමයන් කාර්යය නිමවී දින 10ක් තුළ පියවිය යුතුය. |
| (iv) මු.රෙ. 395 (ඇ) | බැංකු ගිණුම් 58 කට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශයන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව නිසි පරිදි බැංකු සැසඳුම් පිළියෙල කළ නමුත්,2020 වර්ෂයේ රටෙහි පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අප ආයතනයද වරින් වර වසා තබන ලදි. එම හේතුවෙන් මාසිකව විගණනයට බැංකු සැසඳුම් ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර සියලුම බැංකු සැසඳුම් වාර්තා එකවර යොමුකරන ලදි. | බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (v) මු.රෙ. 395 (ඌ) | මුදල් පොත ලිවීම, චෙක්පත් ලිවීම, එකතු වන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, මුදල් පොත පවත්වා ගෙන යෑම සඳහා වැඩ බෙදීමේ ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | විමසුමෙහි සඳහන් කරුණු සමඟ එකඟ වේ. | මුදල් පොත හා ආශ්‍රිත කාර්යයන් සඳහා වැඩ බෙදීමේ ක්‍රමය අනුගමනය කළ යුතුය. |
| (ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 වන වගන්තිය | කාර්තුමය වශයෙන් හෝ මාසික වශයෙන් වන බදු කාලසීමාව අවසන් වන මාසයේ අවසන් දිනට පෙර එකතු කළ අගය මත බදු පියවිය යුතු වුවද 2020 ජනවාරි 01 දිනට පැරණි ශේෂ එකතුවක් සමඟ රු.75,647,389 ක් වූ එකතු කළ අගය මත බදු 2020 දෙසැම්බර් 31 දින තෙක් පියවීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එකතු කළ අගය මත ගෙවිය යුතු බදු මාසිකව වාරික වශයෙන් ගෙවීම් කරනු ලබයි. | බදු පනත අනුව බදු කාලසීමාව අවසන් වන මාසයේ අවසන් දිනට පෙර එකතු කළ අගය මත බදු පියවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2020 ඔක්තෝබර් 22 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (අ) හා (ආ) වගන්ති | ධාවන තත්ත්වයේ නොමැති, අලුත්වැඩියාව ආර්ථික නොවන වාහන අපහරණය සඳහා උපදෙස් ලබා දී තිබුණද ධාවන තත්ත්වයේ නොමැති අංක 4502 දරන JCB යන්ත්‍රය සඳහා ආර්ථික වශයෙන් ඵලදායී වන ලෙස බාණ්ඩ ලෙස හඳුනාගෙන අපහරණය හෝ අලුත්වැඩියාවට කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් ගෙන නොතිබුණි. | මෙම යන්ත්‍රය කිරින්ද ධීවර වරායේ කැණීම් කරන ලද වැලි,ලොරි වලට පැටවීම සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදි .එහෙත් මෙම යන්ත්‍රය අවස්තා කිහිපයකදීම අකර්මණ්‍ය වූ අතර යන්ත්‍රය යතා තත්වයට පත්කිරීම සඳහා එහිදී විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව දන්වන ලදි.මෙම යන්ත්‍රය වෙනත් වරායන් සඳහාද අවශ්‍ය නොවන බැවින් මෙන්ම කිරින්ද ධීවර වරායේ වැලි අලෙවිය නතර වීමත් හේතුවෙන් එවැනි විශාල පිරිවැයක් දරා මෙම යන්ත්‍රය අලුත්වැඩියා කිරීම නිෂ්ඵල කාර්යයක් වන බැවින් අලුත් වැඩියා කටයුතු සිදු නොකරන ලදි.<br>එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව මෙම යන්ත්‍රය අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | අබලන් වාහන , අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර පාවිච්චි කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් වෙනුවෙන් චක්‍රලේඛ ප්‍රකාරව යාවත්කාලින කරන ලද වත්කම් ලේඛනයක් පවත්වා ගතයුතු වුවත්, සංස්ථාව විසින් රු.6,679,408,837ක්වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් , ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ වන විට වර්ෂය දක්වා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇති අතර එහි 2020 පිටපතක් රජයේ විගණන අංශය වෙත යොමුකර ඇති බව දන්වා සිටිමි. | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) වගන්තිය | වටිනාකම රු.6,689,000 ක භූමිතෙල් ඉන්ධන පොම්ප 07 ක් මිලදී ගැනීම සඳහා වූ ටෙන්ඩරය ජාතික පුවත්පතක පලකර නොතිබුණි. | 2018 දෙසැම්බර් 21 දින දිනමින සහ Daily News පුවත්පත්හි ඉන්ධන පොම්ප මිලදී ගැනීම සහ මිල ගණන් කැඳවීමට අදාළ දැන්වීම පළ කරන ලදි. ඒ අනුව පිළිගත් ආයතන 06ක් විසින් මිලගණන් ඉදිරිපත් කරන ලදි. නමුත් නිවැරදි පිරිවිතර අනුව එම ආයතන මිලගණන් ඉදිරිපත් කර නොතිබුණු බැවින් නැවත ටෙන්ඩරය 2019 ජූලි 11 වන දින කැඳවන ලදි. ඒ අනුව එදින මිලගණන් ඉදිරිපත් කළ ආයතන 06ක් වෙතින් මිලගණන් කැඳවූ අතර සංස්ථා නිල වෙබ් අඩවියේ අදාළ ටෙන්ඩරය ප්‍රසිද්ධ කරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සියලු මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.236,010,941 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.71,111,703ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.164,899,238ක ඌනතාවය වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම ඌනතාවය වැඩිවීමට වරායන්වල මෙහෙයුම් පාඩුව සියයට 233කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවනතා විශ්ලේෂණය**

වරායන්වල මෙහෙයුම් කටයුතු වලින් ඉපයූ ලාභ/අලාභ තත්ත්වය පහත පරිදි විය.

**මෙහෙයුම් ලාභය හෝ අලාභය**

| | ධීවර වරාය | 2020 | 2019 | අඩුවීමේ සහ වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | රු. | | |
| 1. | බේරුවල | 764,410 | 1,873,194 | (59) |
| 2. | ගාල්ල | (3,084,949) | (10,686,069) | 71 |
| 3. | මිරිස්ස | 1,878,008 | 7,237,363 | (74) |
| 4. | පුරාණවැල්ල | (7,496,629) | (8,189,577) | 8 |
| 5. | තංගල්ල | (43,142,804) | (39,310,703) | (10) |
| 6. | කිරින්ද | (25,615,510) | (16,720,969) | (53) |
| 7. | කෝඩ්බේ | (5,750,505) | (37,645) | (15,176) |
| 8. | දොඩන්දූව | (11,884,864) | (11,601,386) | (2) |
| 9. | හික්කඩුව | (15,386,764) | (11,892,984) | (29) |
| 10. | කල්පිටිය | (3,794,502) | (9,025,468) | 58 |

| | | | | |
|---|---|---|---|---|
| 11. | කුඩාවැල්ල | 7,352,427 | 7,672,889 | (4) |
| 12. | පානදුර | (14,475,168) | (12,315,480) | (18) |
| 13. | මීගමුව | (12,218,701) | (6,040,409) | (102) |
| 14. | හම්බන්තොට | (26,012,473) | (22,898,194) | (14) |
| 15. | අම්බලන්ගොඩ | (5,966,434) | (11,220,653) | 47 |
| 16. | හලාවත | (12,567,229) | (13,036,201) | 4 |
| 17. | වාලච්චේන | (17,312,954) | (17,388,158) | 0 |
| 18. | නිල්වැල්ල | (6,416,508) | (3,241,308) | (98) |
| 19. | දික්ඕවිට | 119,213,816 | 170,622,402 | (30) |
| 20. | සුදුවැල්ල | (12,429,764) | (10,035,988) | (24) |
| 21. | මයිලඩි | (9,651,469) | (17,499,801) | 45 |
| 22. | කළමැටිය (2020 වර්ෂයේ ආරම්භ කර ඇත) | (8,176,856) | නැත | නැත |

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉන්ධන ආදායම වැඩිවීම නිසා වරායන් කීපයක වාසිදායක තත්ත්වයක් නිරූපනය විය.කෙසේ වුව ද, ධීවර වරායන් 22 න් ධීවර වරායන් 18ක් සමාලෝචිත වර්ෂය තුළ රු.112,175,422 ක අලාභ ලබා තිබුණු අතර ඉකුත් වර්ෂයේදීද රු.33,735,144 ක අලාභයක් පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.78,440,278 කින් අලාභය වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බේරුවල වැඩ ඒකකයේ රු.26,649,965ක අලාභයක් ලබා තිබුණු අතර ඉකුත් වර්ෂයේ රු.24,735.590 ක් වූ අතර රු. 1,914,366 කින් අලාභ තත්ත්වය වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 3.1:1 | 3:1 | 2.8:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 2.7: 1 | 2.67: 1 | 2.5: 1 |
| දළ ලාභ අනුපාතය | 1.46% | (10.02%) | (43%) |

(අ) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ දළ ලාභ අනුපාතය සියයට 1.46ක් වූ අතර 2019 වර්ෂයට අදාළව එය සෘණ 10.02ක් විය.සමාලෝචිත වර්ෂයේදී පාඩුව වැඩිවීම හේතුවෙන් එම ප්‍රතිශතය සෘණ 43 දක්වා වැඩිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතයෙහි පසුබෑමක් දක්නට ලැබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ)කුඩාවැල්ල ධීවර වරාය පරිශ්‍රයේ පර්චස් 15.12 ක බද්ධ ප්‍රදානය කිරීමේදී යම් බදුකරු විසින් ඉඩමක් පතුරු අයිස් නිෂ්පාදනාගාරය සඳහා 2019 අක්‍රමිකතාවයක් සිදුවූ බවට මෙහෙයුම් කටයුතු

| | | |
|---|---|---|
| නොවැම්බර් 07 දින මාසිකව බදු කුලිය රු.115,000 බැගින්, බදු දී තිබුණද බදු ගිවිසුමට එළඹීමේ දිනය 2020 ජුනි 11 දක්වා ප්‍රමාද කර තිබුණි. විගණිත දිනය වූ 2021 අප්‍රේල් 27 දක්වාත් පතුරු අයිස් නිෂ්පාදනාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ වී නොතිබූ අතර බදු දීමෙන් වසරක් ඉක්ම ගොස් තිබුණද කිසිඳු බදු ආදායමක් අයකර ගෙන නොතිබුණි. මේ අනුව ගිවිසුම්ගත දින වන 2020 ජුනි 11 දින සිට 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට මාස 06 ක රු.690,000 ක් වූ බදු ආදායමක් අහිමි වී තිබුණි. | පෙත්සම් ඉදිරිපත්වීතිබූ බැවින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර අවසන් වන තෙක් බලාසිටිමට සිදුවූ බැවින් ප්‍රමාද විය. පසුව අමාත්‍යාංශය විසින් සභාපතිවරයා වෙත ලබාදෙන ලද උපදෙස් මත 2020 ජුනි 11 වන දින ගිවිසුමට එළඹෙන ලදි.<br>කොරෝනා වසංගතය හේතුවෙන් ව්‍යාපාරික කටයුතු ආරම්භකළ නොහැකිවූ බව දන්වමින් බදු ගැනුම්කරු විසින් සහන ඉල්ලා ඇති අතර ඒ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 07 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර, එහි<br><br>සඳහන් තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින්, ප්‍රමාණවත් තොරතුරු සහිතව ඉදිරි දින පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වෙත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත්කරන ලෙසය.<br>ඒ අනුව ඉදිරි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි ගනු ලබන තීරණයන් ඔබ වෙත දැනුම්දීමට | ආරම්භ නොකරන්නේ නම් වෙනත් අයෙකුට හෝ බදු දී ආදායම් ලබා ගත යුතුය. |
| (ආ)2020 ජනවාරි 01 දිනට ලෙජරය අනුව ධීවර දිරිසවිය ගිණුම් ලෙස වෙන්කර තිබුණු රු.8,610,910 ක වටිනාකම එම ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කර නොමැති අතර අඛණ්ඩව වෙන්කිරීමක් ලෙස දක්වා තිබුණි. | ධීවර පවුල් වෙත කෙරෙන සුභසාධන කටයුතු වෙනුවෙන් වෙන්කර තිබෙන ප්‍රතිපාදනයක් වන අතර ධීවර පවුල් වෙත කෙරෙන සුභසාධන කටයුතු නවතා ඇති බැවින් දිරිසවිය වෙන් කිරීමේ ගිණුමෙහි ශේෂයක් පෙන්නුම් කරනු ලබයි. | සුභසාධක කටයුතු වෙනුවෙන් වෙන් කළ මුදල් එම අදාළ කාර්යයට යෙදවිය යුතුය. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ශේෂයත්, බැංකු සැසඳුම් අනුව බැංකු ශේෂයත් අතර බැංකු ගිණුම් 09කට අදාළව රු.12,770.988 ක වෙනසක් නිරූපනය විය. | 2020 දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව බැංකු ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ශේෂයන්හි වෙනස්කම් සඳහා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන | බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව පිළියෙල කළ යුතු අතර වෙනස්කම් තිබේනම් ඒ පිළිබඳ |

| | | |
|---|---|---|
| | පිළියෙළ කිරීමේදී ජ'නල් යොදා නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 ජුනි මස සිට අම්බලන්ගොඩ ධීවර වරායේ පර්චස් 40 ක් රු.225,000 (වැට් සහිත) මාසික බදු වාරික වටිනාකමකට බදු දී තිබූ අතර වර්ෂ 8 කට පසු රජයේ තක්සේරු වාර්තාවක් හෝ සපයාගැනීමට කටයුතු නොකර 2019 සැප්තැම්බර් සිට හුදෙක් බදු ගැණුම්කාර ආයතනයේ ඉල්ලීම මත රු.105,000 (වැට් සහිත)අගයකට නැවත බදු දී තිබුණි. | අප විසින් බදු ගැණුම්කරු වෙත බදු දෙන ලද්දේ පර්චස් 40ක හිස් ඉඩම පමණක් වන අතර අදාළ ආයතනය විසින් අයිස් යන්ත්‍රාගාරය ඉදිකර යන්ත්‍රසූත්‍ර ඔවුන් විසින්ම සවිකරන ලදි. මෙම ආයතනය වෙත<br><br>අභ්‍යන්තර තක්සේරු වාර්තාව පදනම් කර ගනිමින් බදු දී ඇති අතර මේ වන විට රජයේ තක්සේරුව ලබා ගැනීමට නියමිත බවත් ඒ අනුව එම රජයේ තක්සේරුව අභ්‍යන්තර තක්සේරුවට වඩා වැඩි වුවහොත් එම වැඩි මුදල් ලබා ගැනීමට ප්‍රදානය කිරීමේ ලිපියේ දින සිට අයකර ගත හැකි පරිදි අවශ්‍ය කොන්දේසි ගිවිසුමේ විධිවිධාන යොදා ඇති බවද දන්වා සිටිමි. | බදු දේපළ සඳහා බදු මුදල් රජයේ තක්සේරුවක් මත අය කිරීමට හෝ විවෘත ටෙන්ඩර් පරිපාටි අනුගමනය කර නව බදුකරුවෙකු සොයා ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුඩාවැල්ල ධීවර වරායේ 2017 අප්‍රේල් 11 දින සීමා මායිම් සලකුණු කිරීමකින් තොරව බදු ගැණුම් පාර්ශවයට මාසිකව රු.70,000 ක වැට් සමඟ වටිනාකමකට බදු දී ඇති ලොට් y හි පර්චස් 37.11ට අමතරව පර්චස් 5.11 ක බිම් කොටසක් භුක්ති විඳිමින් තිබුණද එම අතිරේක බිම් කොටස් සඳහා අතිරේක ගිවිසුමක් යටතේ වෙනම බදු කුලියක් අයකිරීම හෝ අනවසරයෙන් භුක්ති විඳින කොටස් වරාය කළමනාකාරිත්වයට පවරා ගැනීම හෝ යන කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2017 වර්ෂයේ අදාළ බදු ගැණුම්කරු වෙත මෙම පරිශ්‍රය බදුදීමේදී පැරණි පිඹුරුපත් පදනම් කරගෙන බදුදී ඇති බවත් පසුව එකී පිඹුරේ සඳහන් භූමි ප්‍රමාණයට වඩා වැඩි භූමි ප්‍රමාණයක් බදුපාර්ශවය බුක්ති විඳින බව අප ආයතනයට නිරීක්ෂණය වූ බවත් ඒ අනුව අදාළ භූමිප්‍රමාණය මැන බැලීමට ආයතනය විසින් කටයුතු කළ අතර එම මැනබැලීමේදි වැඩිපුර පර්.5.11 ක් බදුපාර්ශවය භුක්ති | භුක්ති විඳින ලද බිම් කොටස සඳහා නව බදු ගිවිසුමක් යටතේ බදුකුලිය අයකිරීම හෝ පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විදින බව අනාවරණය කර ගත් බැවින් එකී වැඩිපුර භූමි ප්‍රමාණය සඳහා අභ්‍යන්තර තක්සේරුවක් සිදුකර එකී වැඩිපුර භුක්ති විදින දේපළ සඳහා 2021 දෙසැම්බර් 07 වන දින අදාළ බදු ගැණුම්කරුවෙත ප්‍රදානයකිරීමේ ලිපිය යොමුකර ඇතිබව දන්වා සිටිමි. | |
| (ආ) ඉහත සඳහන් කුඩාවැල්ල ධීවර වරාය බදු දීමේදී 2017 ජුනි 30 සංශෝධිත බදු ප්‍රදාන ලිපිය අනුව මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල අයිස් යන්ත්‍රාගාරයක් ලෙස පරිවර්තනය කිරීම සඳහා වසරක සහන බදු කාලසීමාව ලබාදීමෙන් පසු 2018 අප්‍රේල් 10 දින සිට මාසිකව රු.70,000 ක කුලියකට වසර 20 ක කාලයක් සඳහා පර්චස් 37.11 ක ඉහත භූමිය ඇතුළු ගොඩනැගිල්ල ටෙන්ඩර් පටිපාටි අනුගමනය නොකර බදු දී තිබුණු අතර රජයේ තක්සේරු වටිනාකමක් ද ලබාගෙන නොතිබුණි. තවද 2019 නොවැම්බර් 07 දින සිට අයිස් නිෂ්පාදන ආයතනයක් වෙත වසර 25 ක කාලසීමාවකට පර්චස් 15.12 ක SSP 327 පිඹුරේ ලොට් (X) පතුරු අයිස් නිෂ්පාදනාගාරයක් සඳහා රු.115,000 ක බදු කුලියක් යටතේ බදු දී තිබුණු අතර මෙම අවස්ථා දෙකෙහිදීම විවෘත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර නොතිබුණි. | මෙම බදුපරිශ්‍රය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බලා ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර එහි නිර්දේශ මත ප්‍රදානය කරන ලදි. | රජයේ තක්සේරු වටිනාකමට ඉඩම් බදුදිය යුතුය. |
| (ඇ) පැරළිය ධිවර වරායේ වැලි ඉවත් කිරීම සඳහා අවශ්‍ය යාත්‍රා තිබියදී වැලි කියුබ් 20,581 ක් ඉවත් කිරීම සඳහා වසර 03 කට පෞද්ගලික සමාගමකට 2018 ඔක්තෝබර් 23 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද කොන්ත්‍රාත්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එසේ ඉවත් කළ යුතු සම්පූර්ණ වැලි ප්‍රමාණය වැලි කියුබ් 20,581 ක් වුවද 2018 ඔක්තෝබර් 23 දින සිට 2020 අගෝස්තු දක්වා වැලි කියුබ් 3,426 ක් එනම් සියයට 16 ක් පමණක් ඉවත් කර තිබුණු අතර ධීවර වරාය තුළට යාත්‍රා පිවිසීමට වැලි ඉවත් නොකිරීම නිසා වරාය බේසම නඩත්තු කිරීමේ සංස්ථාවේ අරමුණු ද ඉටුවී නොතිබුණි. | සංස්ථාව කොන්ත්‍රාත්කරු සමග අදාළ ගිවිසුම අත්සන් කර තිබුණි. වෙරළ සංරක්ෂන දෙපාර්තමේන්තුවේ කොන්දේසි හා නිර්දේශ ප්‍රකාරව වර්තමානයේ නැවත මෙම වරායේ බේසමෙහි වැලි ඉවත් කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුමකට එළඹ ඇති අතර, මේ වන විට කියුබ් 2750 ක් බේසමෙහි වැලි ඉවත් කිරීම සිදු කර ඇත. | වැලි ඉවත් කිරිමේ කාර්යය බාහිර පාර්ශවයකට පැවරීම පිළිබඳව පරීක්ෂණය සිදුකළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ , පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සංස්ථාවට අයත් "වැලිගොච්චා" යාත්‍රාවේ අලුත්වැඩියා පිරිවැය හා වර්තමාන තත්ත්වය පිළිබඳ 2020 සැප්තැම්බර් 30 දිනැති තාක්ෂණික වාර්තාවකින් අනතුරුව යාත්‍රාව අපහරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද උක්ත යාත්‍රාව අපහරණය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් කටයුතු කර නොතිබුණි. මේ වන විට යාත්‍රාව දිරාපත් වෙමින්, වසර 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පවතින විට සමාලෝචිත වර්ෂයේදී එම යාත්‍රාවේ නඩත්තුව හා පවත්වාගෙන යාම සඳහා රු.3,670,247 ක වැටුප් වියදම් දරා කාර්යමණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. | විගණන විමසුමේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වන අතර එම නැවෙහි ආරක්ෂාව සහ නැව දිය යට යාම වළක්වා ගැනීමටත් යම් හෙයකින් නැව වරාය බේසම තුළ පෙරළීමක් හෝ දිය යට යාමක් සිදුවුවහොත් නැවත ගොඩගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වේ. එබැවින් නැවෙහි ආරක්ෂාව සඳහා තාවකාලිකව සේවකයන්<br><br>කිහිපදෙනෙකු නැවෙහි රඳවා තබා ඇත.<br><br>මෙම නැව අපහරණය කිරීම සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එම ආයතනය විසින් මීට පෙර මෙවැනි කැණීම් යාත්‍රාවක් තක්සේරු කර නොමැති බැවින් නැව තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බව දන්වා ඇත. ඒ අනුව තක්සේරු වාර්තා ලැබීමෙන් අනතුරුව නැව අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | නිෂ්ක්‍රීය වත්කම් නොපමාව අපහරණය කළ යුතුය. |
| (ආ)2018/ 2019 වර්ෂ වලදී ධීවර වරායන්හි සවිකරන ලද ගැලුම් 8000 ඉන්ධන ටැංකි වලින් රු.3,380,000ක් වටිනා හලාවත හා අම්බලන්ගොඩ වරායන්හි සවි කරන ලද ඉන්ධන ටැංකි 02 සඳහා විදුලිය ලබාගැනීමට කළමණාකාරීත්වය මේ දක්වා කටයුතු කර නොමැති බැවින් 2022 මාර්තු 30 දින තෙක් භාවිතා නොකරන බව අනාවරණය විය. | මේ වනවිට ඉන්ධන ටැංකි 5ක් ඉන්ධන නිකුත් කිරීමේ කටයුතු සිදුකරන අතර, හලාවත ධීවර වරායේ විදුලි සම්බන්ධතාවය මේ වන විට ලබාදී ඇති නමුත් වර්තමානයේ පවතින ඉන්ධන අර්බුධය හේතුවෙන්,ඉන්ධන නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අපහසුවී ඇත. | අවශ්‍ය විදුලි පහසුකම් ලබා දී වත්කම් පූර්ණ උපයෝගිතාවය කින් යුතුව පාවිච්චි කිරීම සඳහා කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) සංස්ථාවේ අම්බලන්ගොඩ ධීවර වරායේ පර්චස් 2017 දෙසැම්බර් මස යොමු බදු දී ඇති දේපළ සඳහා 40 ක භූමි ප්‍රමාණයක් 2019 මාර්තු 19 සිට කරන ලද පුවත් පත් දැන්වීම රජයේ තක්සේරුවක්

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක වන පරිදි පිෂින් ලයින් ආයතනයක් වෙත වර්ෂ 25 ක කාල සීමාවක් සඳහා අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා මාසිකව රු.126,670 ක බදු මුදලකට බදු දී තිබුණද උක්ත බදු දීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කර නොතිබුණි. 2019 අප්‍රේල් 4 දින එළඹි උක්ත බදු ගිවිසුම ප්‍රකාරව බදු දේපළ සඳහා රජයේ තක්සේරුවක් ලබාගැනීමට දෙපාර්ශවය එකඟ වුවද විගණිත දිනය වන තුරුත් බදු දී ඇති පර්චස් 40 ක භූමිය සඳහා රජයේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනුව පෞද්ගලික ආයතනයක් විසින් අම්බලන්ගොඩ වරායේ පිහිටි පර්චස් 30ක හිස් භූමි ප්‍රමාණය අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා බදු දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව අභ්‍යන්තර තක්සේරු වාර්තාවක් ලබාගැනීමෙන් අනතුරුව, 2018 දෙසැම්බර් 06 සහ 2018 දෙසැම්බර් 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අනුව අදාළ<br><br>දේපළ දීර්ඝ කාලීනව බදු දෙන ලදී. මේවන විට රජයේ තක්සේරු වාර්තා ලැබී ඇති බවද දන්වා සිටිමි. | ලබාගෙන බදු මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වාලච්චේන ධීවර වරායේ පර්චස් 40 ක් 2019 වර්ෂයේ නැවත වරක් වසර 25 ක් සඳහා බදු දීම හා බේරුවල ධීවර වරායේ පර්චස් 30 ක් 2019 වර්ෂයේ වසර 25 ක් සඳහා බදු දීමේදී යෝජනා කැඳවීම හෝ ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කිරීම සිදුකර නොතිබුණි. | සවුත් ලංකා, නෝර්ත් ඊස්ට් සහ ලංකා අයිස් යන පෞද්ගලික ආයතන එකම අධ්‍යක්ෂක මණ්ඩලයක් යටතේ පවත්වාගෙන යන ශාඛා වන අතර මෙම ආයතන දීර්ඝ කාලයක සිට ගාල්ල, බේරුවල හා වාලච්චේන යන ධීවර වරායන් වල නිසි ආකාරයෙන් අයිස් යන්ත්‍රාගාර පවත්වා ගෙන යන අතර එමෙන්ම නිසිපරිදි ගෙවීම්ද සිදුකරන බැවින් අදාළ පාර්ශවයේ<br>ඉල්ලීම් සලකා බලා ටෙන්ඩර් මණ්ඩලය වෙත යොමුකර ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය පරිදි බදු ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කරන ලදී. | දේපළ බදු දීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කළ යුතුය. |
| (ඇ) ඉන්ධන වේගය මිනිත්තුවට ලීටර් 120 – 180 ත් අතර ඩීසල් පොම්ප 10 ක් රු. 30,993,264 කට මිලදී ගැනීමේ ටෙන්ඩර් ප්‍රදානයට අදාළ තාක්ෂණික පිරිවිතර පරීක්ෂා කිරීම ගිවිසුම්ගත වීමට පෙර සිදුවිය යුතු වුවද, 2019 පෙබරවාරි 26 දින ගිවිසුම්ගත වීමෙන් පසුව විදේශගතව තාක්ෂණික පිරිවිතර පරීක්ෂා කිරීම හා පුහුණුව සඳහා නිලධාරීන් දෙදෙනෙකු චීනයට ගොස් තිබුණි. එය ටෙන්ඩර් කොන්දේසිවල ඇතුළත් කරුණක් නොවන බව ද නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ඩීසල් පොම්ප සැපයීම, සවිකිරීමේ සමස්ත ක්‍රියාවලිය නියමිත දින 120 ඉක්මවා තවත් මාස 06 ක් ප්‍රමාද වී තිබූ අතර කාලය දිගු කිරීම් ලබාදීමේදී,ටෙන්ඩර් කොන්දේසි | 2019 පෙබරවාරි 26 වන දින ඩීසල් ඉන්ධන පොම්ප මිලදීගැනීම සඳහා Colombo Machinery and Equipment (PVT) Ltd ආයතනය සමග ගිවිසුම් ගත වූ අතර අදාළ සැපයුම් බෙදා හැරීම හා සවිකිරීම සඳහා දින 120 ක කාලයක් ලබා දී තිබුණි.<br>මෙම ඉන්ධන පොම්ප 10 චීනයේ සිට මෙරටට ආනයනය කළයුතුව තිබූ අතර එම ඉන්ධන පොම්ප ආනයනයට පෙර ඒ | ටෙන්ඩර් කොන්දේසිවල ඇතුළත් නොවූ විදේශගත පුහුණුව පිළිබඳ පරීක්ෂණයක් සිදුකළ යුතු අතර අවශ්‍ය පිළිවිතරවලට අනුව භාණ්ඩ ලබා නොගැනීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

අනුව ප්‍රමාද ගාස්තු වටිනාකම රු.59,391,744 ක් අයකිරීමට කටයුතු කර ගෙන නොතිබූ අතර, මෙම ඉන්ධන පොම්ප වල ඉන්ධන කාන්දු වීම්, ද්විත්ව ක්‍රියාකාරීත්වයක් නොවීම ඇතුළු විවිධ තාක්ෂණික දෝෂ මතු වී තිබුණි.

පිළිබඳව තාක්ෂණික පුහුණුවක් ලබා ගැනීම සඳහා අප ආයතනයේ නිලධාරීන් දෙදෙනකු චීනය වෙත යොමු කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව තාක්ෂණික පුහුණුව හා ලබා දුන් පිරිවිතර පරික්ෂා කර එම පිරිවිතර නිවැරදිද යන්න පිළිබඳ සහතිකයක් ලබා ගැනීම ටෙන්ඩර් කොන්දේසි වල පූර්ණ

අවශ්‍යතාවයක් වී තිබුණි. චීන තානාපති කාර්යාලය වීසා බලපත්‍ර ලබා දීම මාස 04ක පමණ කාලයක් ප්‍රමාද වීමක් සිදු විය. පිරිවිතර පරික්ෂා කිරීමකින් තොරව හා පුහුණුවකින් තොරව ඉන්ධන පොම්ප කිරීම නැව්ගත කිරීම ටෙන්ඩර් කොන්දේසි වලට පටහැනි වූ බැවින් ඉන්ධන පොම්ප 10 මිලදී ගැනීම සැපයීම හා සවිකිරීම යන සමස්ත ක්‍රියාවලියම ප්‍රමාද වීමක් සිදු විය. එම කාර්යය නිම කිරීමට 2020 ජනවාරි මස 30 දක්වා කාලය දීර්ඝ කිරීමක් ලබා දි තිබුණි.

(ඇ) පානදුර ධීවර වරායේ වැලි කැණීම් කටයුතු සඳහා ලබා දී තිබූ ආයතනය එය පැහැර හැරීමෙන් පසු එහි අධ්‍යක්ෂ මණ්ඩලයෙන්ම සමන්විතව වෙනත් නමකින් ආරම්භකළ ආයතනයක් වෙත අංක CFHC/FD/DPC/2019/6/15 දරන ටෙන්ඩර් මණ්ඩල පත්‍රිකාව අනුව එම ධීවර වරායේ වැලි කැණීම් කටයුතු සඳහා ප්‍රසම්පාදනය ලබා දී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 ඡේදය අනුව ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුගේ තොරතුරු, හැකියාව, පළපුරුද්ද ආදී අත්‍යවශ්‍ය නිර්නායක ඇතුළත් වන පරිදි විධිමත්ව ලංසු ලියවිලි සකස් කිරීමද ලංසුකරුවන් විධිමත්ව ඇගයීමට ලක් කිරීමටද තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සාමාජිකයන්ද ප්‍රසම්පාදන කමිටු (PC) සාමාජිකයින්ද තනිතනිවත්, සාමුහිකවත් වගකීමට බැඳේ. ඒ අනුව පෙර වැලි කැණීම් සඳහා ගිවිසුම්ගතව පසුව එම ගිවිසුම උල්ලංඝනය කළ රු.මිලියන 16.8 ක හිඟ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු නොකළ ආයතනයක් වෙත නැවතත් ප්‍රසම්පාදනය පිරිනැමීමට ප්‍රසම්පාදනය මණ්ඩලයත්, තාක්ෂණික ඇගයීම් කමිටුවත් නොසැලකිලිමත් අන්දමින් කටයුතු කර තිබූ අතර

RI Developers (pvt) Ltd ආයතනය වෙතින් අය වීමට ඇති මුදල් අය කර ගැනීම සඳහා නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට නිතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ අනුව මේ වන විට නිතිපති දෙපාර්තමේන්තුව විසින් පැමිණිල්ල කෙටුම්පත් කරමින් සිටින බවත් එම කටයුතු සම්පාදනය වූ වහාම නඩු පැවරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි.

ටෙන්ඩර් ලියවිලි නිකුත් කිරීමේදි අදාළ ආයතනයේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් ලබා ගෙන ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ඒ අනුව RI Develpers (pvt) Ltd. ආයතනය PV 8109 යටතේ ලියාපදිංචි කර ඇති අතර,

නීත්‍යානුකූල නොවන පරිදි ලංසුකරු තෝරා ගැනීම පිළිබඳ වගකීම් පැහැර හැරිය ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.

| | | |
|---|---|---|
| මේ වන විට අයවිය යුතු රු.16,894,356 ක අත්තිකාරම් මුදල ද අයවී නොතිබුණි. | සක්ෂල් නැවුරල් ප්‍රඩක්ට් ආයතනය PV 15011 යටතේ ලියාපදිංචි කර ඇත. ඒ අනුව ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරන ලදී. | |
| (ඉ) ලංකා වරාය නීතිගත සංස්ථාව සඳහා රු.6,689,000 ක වටිනාකමකට භූමිතෙල් පොම්ප 7 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මුහුදු හා වෙරළාශ්‍රිත පරිසරයට ගැලපෙන බවට සනාථ කළ හැකි කිසිඳු තහවුරුවක් නොතිබීම සහ පොම්ප වල මෝස්තරය වෙනස් වී තිබීම (Pattern) යන මූලික බැහැරවීම් සහිත ලංසුකරුවකු වෙත 2019 නොවැම්බර් 19 දින ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | Auto Engineering (Pvt)Ltdආයතනය වෙත ප්‍රධාන පත්‍රය 2019 නොවැම්බර් 05 වන දින නිකුත් කළත් ගිවිසුම්ගත වන ලද්දේ ජනවාරි 07 දිනය. ඉන් අනතුරුව රටෙහි පැවති කෝවිඩ් වසංගතය හේතුවෙන් ඉන්ධන පොම්ප සවිකිරිම ප්‍රමාදවිය.<br><br>එමෙන්ම ඉදිරියේදි කොන්ත්‍රාත්කරුවන් සමග එලඹෙන ගිවිසුම් ප්‍රමාද ගාස්තු අයකිරිම් සම්බන්ධයෙන් වගන්තියක් ඇතුළත් කිරිමට ද කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර භාණ්ඩ මිලදී ගැනීම සිදුකළ යුතු අතර ඊට පටහැනිව ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) තාක්‍ෂණික පිරිවිතරය අනුව ඉන්ධන පොම්පයක වේගය මිනිත්තුවට ලීටර් 150 ක් විය යුතු වුවද, ධීවර වරායන්වලට සැපයූ ඉන්ධන පොම්පවල වේගය මිනිත්තුවට ලීටර් 138 ක් වූ අතර ධීවර වරායන්වල ස්ථාපිතකර තිබුණු ඉන්ධන පොම්ප 08ක 2019 මාර්තු 11 දින වන විට භාවිතා නොකිරීම හේතුවෙන් සැපයුම්කරුට ගෙවුරු.3,824,200 ක් නිෂ්කාර්ය වියදමක්ද වී තිබුණි. තවද, එකඟ වූ පරිදි භාණ්ඩ නොසැපයීම හා අවශ්‍යතාවයට නොගැලපෙන ඉන්ධන පොම්ප සැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගක් ද ගෙන නොතිබුණි. | අදාළ ආයතනය විසින් කොඩ්බේ, දික්ඕවිට, බේරුවල, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල, අම්බලන්ගොඩ යන වරායන් වල පොම්ප 08ක් ස්ථාපිත කර ඇත. ඒ අනුව සංස්ථාව විසින් එම පොම්පයන් ප්‍රයෝජනයට ගෙන ඇති අතර, එම ආයතනය සඳහා අත්තිකාරම් මුදල පමණක් ගෙවා ඇති නමුදු වෙනත් කිසිදු මුදලක් එම ආයතනය වෙත ගෙවීම් කර නොමැත. ඒ අනුව අදාළ පොම්පයන්හී වටිනාකම අත්තිකාරම් මුදල ඉක්මවා ඇති බව දන්වා සිටිමි. | පිරිවිතරවලට නොගැලපෙන ඉන්ධන පොම්පවලට ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග හා එකඟ වූ පරිදි භාණ්ඩ නොසැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012 ජනවාරි 17 දිනැති අංක CFHC/HR/Permanent දරන පත්වීම් ලිපියට අනුව මාසික වැටුප ලෙස රු.37,405ක පිහිටුවා සභාපති රහස්‍ය ලේකම් තනතුරට නිලධාරිණියක් පත්කර තිබුණු අතර මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2022 පෙබරවාරි මස සිට නිවැරදි වැටුප් තලයෙහි පිහිටුවීමට කටයුතු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ තනතුරු සඳහා පමණක් පත්වීම් කළ යුතුය. මෙය නීතිවිරෝධී පත්වීමක් සේ සළකා ක්‍රියාකළ යුතුය. |
| (ආ)සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම් තනතුරු 01ක් අනුමතව තිබුණු අතර එම නිලධාරියාට අමතරව, එම තනතුර සඳහාම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව 2014 සැප්තැම්බර් 02 දින සිට 2016 අගෝස්තු දක්වා තවත් නිලධාරියෙකු පත්කර රු. 1,622,000 ක වැටුප් ගෙවා තිබුණි. | 2014 සැප්තැම්බර් මස එවකට සංස්ථා පාලනාධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් තවත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු පත්කිරීම සිදුකර ඇත.<br>අනුමත කාර්ය මණ්ඩලයට අනුව පවතින්නේ එක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක් පමණක් වන බැවින්, එය සංශෝධනය කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත්ද? යන්න අනාවරණය නොවුණි. මේවන විට ඒ මහතා විශ්‍රාම ගොස් ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ තනතුරු සඳහා පමණක් පත්වීම් කළ යුතුය. මෙය නීතිවිරෝධී පත්වීමක් සේ සළකා ක්‍රියාකළ යුතුය. |
| (ඇ)ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ තනතුරු 16කට අදාළව සුදුසුකම් සහිත නිලධාරීන් බඳවාගැනීමකින් තොරව වැඩ බැලීමේ කාර්යය සිදුකරමින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යමින් තිබුණි. | තනතුරුවලට අදාළව වැඩ බැලීම සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇත. | පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර සේවකයින් බඳවාගත යුතුය. |